# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2369/44 – 2024 පෙබරවාරි මස 02 වැනි සිකුරාදා – 2024.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2019/75.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.05.09 දිනැති හා අංක 2331/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.03.30 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බුත්තල, කුඩා ඔය, ප්‍රගති මාවත පදිංචි එස්. ඒ. කමලසේන මයා සහ 1. කොළඹ 04, මෙල්බර්න් ඇවනිව්, අංක 27 හි පිහිටි සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම 2. බුත්තල, පුද්ගලික තැපැල් මල්ල හි පිහිටි සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම - පැල්වත්ත අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති A40/2023 හා 2023.12.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජනවාරි මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 041360 – 11 (2024/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය - කොළඹ

*නඩු අංකය:* A/40/2023.
IR/COM/05/2019/75.

එස්. ඒ. කමලසේන මයා,
ප්‍රගති මාවත,
කුඩා ඔය,
බුත්තල.

*පළමු පාර්ශ්වය*

එදිරිව

1. සී/ස ලංකා සීනි පුද්ගලික සමාගම,
අංක 27,
මෙල්බන් ඇවනියු,
කොළඹ 04.

2. සී/ස ලංකා සීනි පුද්ගලික සමාගම - පැල්වත්ත,
පුද්ගලික තැපැල් මල්ල,
බුත්තල.

*දෙවන පාර්ශ්වය*

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුල බේරුම්කරණය කිරීමෙන් නිරවුල් කිරීම සඳහා ගරු අමාත්‍යවරයා විසින් පහත සඳහන් යොමු කිරීම 2023.03.30 වන දින සිදු කර ඇත.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ අංක IR/COM/05/2019/75 සහ 2023.03.28 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇත්තේ,

"සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ පැල්වත්ත ඒකකයේ සේවය කළ එස්. ඒ. කමලසේන මහතාට පහත කරුණු මඟින් අසාධාරණයක් සිදු වී තිබේද යන්නත් හා එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් හිමි විය යුතු සහන මොනවාද යන්න වේ."

01. සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ සෙවනගල ඒකකයේ මාස 16ක කාලයක් වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) ලෙස සේවය කළ එස්. ඒ. කමලසේන මහතා පූර්ව නිත්‍ය තනතුර කළමනාකරු (මානව සම්පත්) පත් කර සී/ස ලංකා සීනි පුද්ගලික සමාගමේ පැල්වත්ත ඒකකය වෙත ස්ථාන මාරු කිරීම.

02. ඔහු 2016.10.01 දින සිට කළමනාකරු (මානව සම්පත්) ලෙස සී/ස ලංකා සීනි ( පුද්ගලික) සමාගමේ සෙවනගල ඒකකයට ස්ථාන මාරු කිරීමේදී ලබා දී තිබූ සියලු දීමනා හා වරප්‍රසාද 2018.05.08 වන දින සිට සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ (පැල්වත්ත) ඒකකයට මාරු කිරීමේදී අහිමි කිරීම.

03. සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ පැල්වත්ත ඒකකයේ නිත්‍ය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) තනතුරට පත් නොකර වැඩ බැලීම සඳහා වරින් වර වෙනත් නිලධාරින් පත් කළද එකී තනතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) සඳහා එස්. ඒ. කමලසේන මහතා සුදුසුකම් ලබා තිබේ නම් එම තනතුර ලබා නොදීම.

වශයෙන් අදාළ කාර්මික ආරාවුලට හේතු මා වෙත දන්වා ඇත. ඒ සම්බන්ධව 2023.05.22, 2023.07.10, 2023.08.03, 2023.08.24, 2023.09.26 හා 2023.11.02 යන දිනයන්හි දී පාර්ශ්වයන් බේරුම්කරණ අංශයට කැඳවා අදාළ පරීක්ෂණය පැවැත්විණි. දෙපාර්ශ්වය

විසින්ම ලිඛිත සැලකිරීම් ඇමුණුම් සහිතව ප්‍රතිපාර්ශ්වයට පිටපත් සහිතව ලබා දී ඇත. විශේෂයෙන් පළමුවන පාර්ශ්වය විසින් සිය ඉල්ලීම සමග ඇමුණුම් 43 ක් සමග දීර්ඝව ඉදිරිපත් කළ අතර එම ඇමුණුම් සහිතවම දෙවන පාර්ශ්වයට පිටපත් ලබා දුන් අතර දෙවන පාර්ශ්වය විසින් ද එකී ඉල්ලීම් සම්බන්ධව සිය නිරීක්ෂණයන් ලබා දෙන්නට විය.

පාර්ශ්වයන් විසින් ලිඛිත සැලකිරීම් කරන අතරතුරම මෙම ආරාවුලේ පාර්ශ්වයන් අතර කිසියම් සමථයක් ඇති කර ගැනීම සඳහා දෙවන පාර්ශ්වයේ නීති නිලධාරී වෙත උපදෙස් ලබා දුන් අතර දෙවන පාර්ශ්වයේ ඉහළ කළමනාකාරිත්වය ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් නොදැක්වීම හේතුවෙන් එය අසාර්ථක විය. ඒ අනුව මෙම කාර්මික ආරවුලට හේතු වී ඇති ඉහත දැක්වූ කරුණු 03 සම්බන්ධව ඉදිරිපත් වූ ලිඛිත වාර්තා සහ ඇමුණුම් ඇසුරෙන් පරීක්ෂණය ඉදිරියට පවත්වා ගෙන යාමට තීරණය කරමි.

පළමුවන පාර්ශ්වයේ පළමු වන ඉල්ලීම වන්නේ සී/ස ලංකා සීනි පුද්ගලික සමාගමේ පැල්වත්ත ඒකකයේ කළමනාකරු (මානව සම්පත්) වශයෙන් සේවය කළ තමා එම සමාගම යටතේම ක්‍රියාත්මක සෙවනගල ඒකකයට ස්ථාන මාරු කළ බවත් සෙවනගල ඒකකයේදී වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් වශයෙන් උසස් වීමක් ලබා දුන් බවත් එලෙස රාජකාරි කරමින් සිටින අතර නැවතත් තමාගේ පූර්ව සේවා ස්ථානයට ස්ථාන මාරු කළ බැවින් මාස 16ක් තිස්සේ වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වශයෙන් කළ සේවය පිළිබඳ නොසලකා තමා භුක්ති විඳි වරප්‍රසාද අහිමි කිරීම තුලින් අසාධාරණයක් සිදු කළ බවයි. විශේෂයෙන් සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ පැල්වත්ත ඒකකය හා සෙවනගල ඒකකය එකම සමාගමක් යටතේ ක්‍රියාත්මක වුවද පරිපාලන ව්‍යුහයන් දෙකක් සහිත බව අනාවරණය විය. ඒ අනුව පැල්වත්ත ඒකකයේ සේවක නිලධාරීන්ට වඩා වෙනස් වූ දීමනා හා වරප්‍රසාද සෙවනගල ඒකකයට ලබා දී ඇත. ඒ ආකාරයට එකම ආයතනයක් තුළ ප්‍රාදේශීය පිහිටීම හේතුවෙන් දීමනාවල වෙනසක් ඇතිවීම සිදු විය හැකිය. සමාන තනතුරු දැරුවද සේවය කරන ස්ථානයේ කරනු ලබන රැකියාවේ ස්වභාවය අනුව එනම් සේවා ස්ථානයේ ප්‍රායෝගික දුෂ්කරතාවය අනතුරුදායක රැකියාවක නියුක්තවීම, සාමාන්‍ය පොදු පහසුකම් වලින් ඈත්වීම, ආදි කරුණු හේතු කොට ගෙන එකම තනතුරක වුවද සේවා ස්ථාන දෙකක දීමනා වෙනස් කිරීමේ හැකියාවක් පාලනාධිකාරියට ඇත. එයින් පාලන අධිකාරිය අපේක්ෂා කරන්නේ තෘප්තිමත් සේවකයෙකු වශයෙන් ප්‍රායෝගික දුෂ්කරතා ඇති ස්ථානවලට කාර්ය මණ්ඩලය සේවයේ යොදවා ගැනීමත් උපරිම ඵලදායතාවයකට ලඟා වීමත්‍ය.

කිසියම් නිලධාරියෙකු ඔහුගේ නිත්‍ය තනතුරට වඩා ඉහළ තනතුරක රාජකාරි වැඩ බැලීම සඳහා නම් කළ යුත්තේ එම තනතුරට පත් කිරීමට තරම් වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සහිත අයෙකු බව තහවුරු කර ගැනීමෙන් පසුවය. යම් හෙයකින් වැඩ බලන තනතුරේ සේවය ස්ථිර කිරීමට වුවද වැඩ බලන නිලධාරියා සුදුසු විය යුතුය. ඒ නිසා වැඩ බලන තනතුරකට පත් කළ පසු හා එම තනතුරේ දීර්ඝ කාලයක් සේවය කළ පසු එම නිලධාරියා වැඩ බැලූ තනතුරේ රාජකාරිය පැවරීමට තරම් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් නොමැති අයෙකු බවට ප්‍රකාශ කළ නොහැකිය. එමෙන්ම ඉහළ පරිපාලන තනතුරක වැඩ බැලීමේ පදනමින් එකී රාජකාරි ආවරණය කළ යුත්තේ ඉතා කෙටි කාලයකටය. මෙම ප්‍රශ්න ගත ගැටලුවේදී මාස 16ක පමණ දීර්ඝ කාලයක් පළමු වන පාර්ශ්වකරු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) තනතුරේ රාජකාරි වැඩ බලන පදනමින් ආවරණය කර ගැනීම යහපත් පරිපාලනමය තීරණයක් නොවන බව සඳහන් කරමි. බොහෝ අවස්ථා වල වැඩ බලන තනතුරක සේවය කිරීම එම තනතුර ලබා ගැනීමට මූලික සුදුසුකමක් නොවන බව ඊට අදාළ පත්වීම් ලිපියේම ඒ බව සඳහන් කරනු ලබයි. ඒ නිසා වැඩ බලන තනතුරක වැඩ බැලූ කාලය අවසන් කිරීම හා නිත්‍ය තනතුරට පත් කිරීම නිලධාරියෙකුට කරනු ලබන අගතියක් නොවේ.

සී/ස ලංකා සීනි පුද්ගලික සමාගමේ පැල්වත්ත ඒකකයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර ඉතා දීර්ඝ කාලයක් වැඩ බැලීමේ නිලධාරීන් යොදා ගනිමින් පවත්වා ගෙන ගොස් ඇති බව ඉදිරිපත් කරන ලද දෙවන පාර්ශ්වයේ ලිඛිත දේශන තුලින් පැහැදිළි වෙයි. විශේෂයෙන් 2023.07.25 වන දින මෙම නඩුවට ගොනු කරන ලද දෙවන පාර්ශ්වයේ ලිඛිත දේශනයේ අංක 18 යටතේ 2018 වර්ෂයේ සිට 2023 ජුලි දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කර නොමැති අතර නිලධාරීන් පස් දෙනෙකු වරින් වර ඒ සඳහා වැඩ බැලීමේ පදනමින් පත් කර ඇත. මෙය ආයතනයක ඉතාම දුර්වල පරිපාලන තත්වයක් බව සඳහන් කළ යුතුය. ඉතා දීර්ඝ කාලයක් වැඩ බලන නිලධාරීන් යොදවමින් තනතුරක් පවත්වා ගෙන යාම තුලින් එම තනතුරේ රාජකාරි අපේක්ෂිත මට්ටමට ලඟා නොවන අතර වැඩ බලන නිලධාරිවරයාට කාර්යක්ෂමතාවයකින් යුක්තව හා ඉහළ තීරණ ගැනීමේ හැකියාවකින් යුතුව කටයුතු නොකරන බැවින් එහි අනිටු ප්‍රතිවිපාක එම ආයතනයේ සෙසු කාර්යාලීය මෙන්ම ක්ෂේත්‍ර නිලධාරීන්ටද මාණ්ඩලික නිලධාරීන්ට ද සහාය කාර්ය මණ්ඩලයට ද එක සේ බලපාන බව අවධාරණය කරමි.

ඉහත පැහැදිළි කිරීමට අනුව පළමුවන පාර්ශ්වකාර එස්. ඒ. කමලසේන මහතා පැල්වත්ත ඒකකයේ කළමනාකරු (මානව සම්පත්) වශයෙන් සේවය කරන අතරතුර සෙවනගල ඒකකයට ස්ථාන මාරු කිරීමෙන් අනතුරුව සෙවනගල ඒකකයේ මානව සම්පත් කළමනාකරු වශයෙන් පැල්වත්ත ඒකකයේ නොලැබූ වරප්‍රසාද සහිතව සේවය කළ බවත් ඔහුගේ සේවයේ සතුටුදායක තත්වය හේතුවෙන් සෙවනගල ඒකකයේම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) වශයෙන් වැඩ බැලීම සඳහා තමා පත් කළ බවත් ඒ අනුව පෞද්ගලික වාහන දීමනා, ඉන්ධන දීමනා හා වැඩ බැලීමේ දීමනා වශයෙන් පිළිවෙලින් රු. 50,000/-, රු. 15,000/-, රු. 15,000/-ක් වශයෙන් රු. 80,000/-ක් දීමනා ලබා දී ඇති බවත් පළමුවන පාර්ශ්වකරු කියා සිටි. එම දීමනා 2016.10.01 දින සිට 2018.04.30 දක්වා තමා වෙත ලබා දුන් බව ද කියා සිටී. පසුව 2018.05.08 වන දින පැල්වත්ත ඒකකයට නැවත ස්ථාන මාරු කිරීම හේතුවෙන්

එම දීමනා සියල්ලම තමාට අහිමි වු බව ද කියා සිටි. ඊට අමතරව ඔහු සෙවනගල ඒකකයේ කළමනාකරු මානව සම්පත් වශයෙන් සේවය කරන අවධියේදී එම තනතුරටම සුවිශේෂි වු ගමන් වියදම් සහ ඉන්ධන දීමනා වශයෙන් ලබා දුන් දීමනාද නැවත පැල්වත්ත ඒකකයට ස්ථාන මාරු වු නිසා අහිමි වු බව ද කියා සිටි. ඒ අනුව ඔහුගේ ඉල්ලීම වන්නේ එලෙස අහිමි කළ දීමනා තම නිත්‍ය සේවා ස්ථානය වන පැල්වත්ත ඒකකයේදී ද ලබා දිය යුතු බවයි.

නමුත් දෙවන පාර්ශ්වකාර ආයතනය වෙනුවෙන් ප්‍රකාශ කරනු ලබන්නේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන 02 ක දීමනා එකම තනතුරක වුවද වෙනස් බවත් එක් ඒකකයකදී ලබා දුන් දීමනා පූර්ව සේවා ස්ථානයට පැමිණි පසු තව දුරටත් වලංගු නොවන බවයි. විශේෂයෙන් රාජකාරී වැඩ බැලීම වෙනුවෙන් දීමනා ලබාදීම හා එම රාජකාරි වැඩ බැලීම අවසන් කිරීමත් සමගම එම දීමනා අහිමි වීම පළමුවන පාර්ශ්වකරුට පමණක් නොව රාජකාරියේ වැඩ බලන තනතුරක සේවය කරන ඕනෑම අයෙකුට මුහුණදීමට සිදු වන තත්වයක් බව දෙවන පාර්ශ්වකරු කියා සිටී. දෙවන පාර්ශ්වකරුවන් වැඩි දුරටත් කියා සිටින්නේ මෙම සමාගම රජය සතු සමාගමක් වන අතර රජයේ දෙපාර්තමේන්තුවක මෙන් අනුමත සේවක සංඛ්‍යාවක් නිශ්චිත හා අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියක් නොමැති වුවද ආයතනය වෙනුවෙන් සකස් කර ගත් පරිපාලන ව්‍යුහයක් ක්‍රියාත්මක වන බවයි. ඒ නිසා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීතිවල දැක්වෙන ආකාරයට තනතුරක දීර්ඝ කාලයක් වැඩ බැලීම සිදු කළ ද එකී වැඩ බැලීම අවසන් වීමත් සමග ඒ දක්වා භුක්ති විදි සියලු වරප්‍රසාද අහිමිවීම සාමාන්‍ය තත්වයක් බවයි.

ඉහත දැක් වූ සියලු තත්වයන් සලකා කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් මා වෙත යොමු කරන ලද ප්‍රශ්න ගත කාර්මික ආරවුලට අදාළ ප්‍රශ්න සඳහා පහත පරිදි පිළිතුරු ලබා දෙමි.

01. සී/ස සීනි පුද්ගලික සමාගමේ සෙවනගල ඒකකයේ මාස 16ක කාලයක් වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මානව සම්පත් ලෙස සේවය කළ එස්. ඒ. කමලසේන මහතා පූර්ව නීත්‍ය තනතුරට (කළමනාකරු මානව සම්පත්) තනතුරට පත් කර සී/ස ලංකා සීනි පුද්ගලික සමාගමේ පැල්වත්ත ඒකකය වෙත ස්ථාන මාරු කිරීම.

**පිළිතුර** - කිසියම් නිලධාරියෙකු සිය නිත්‍ය සේවයට අමතරව ඉහළ තනතුරක හෝ සමාන තනතුරක රාජකාරි වැඩ බලන පත්වීමක් ලබාදීම ඉහළ පරිපාලන අධිකාරියට සිදු කළ හැකි කරුණකි. එවැනි වැඩ බැලීමේ පත්වීමක් කෙටි කාලීන විය යුතු අතර එම තනතුරේ වැඩ බලන කාලය තුළ ඊට අදාළ සියලු වරප්‍රසාද වැඩ බලන නිලධාරියා සතු වන්නේය. ඒ ආකාරයට පළමුවන පාර්ශ්වකරු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) ලෙස වැඩ බලන කාලය තුළ ඉහළ වැටුපක් හා එම තනතුරට අදාළ දිමනා ලබා ගෙන ඇත. එම තනතුර දරමින් සිටියදී 2018.05.08 වන දින ඔහුගේ නිත්‍ය සේවා ස්ථානය වන පැල්වත්ත ඒකකයට නැවත ස්ථාන මාරු කිරීම හා ඔහුගේ නිත්‍ය තනතුර වන කළමනාකරු (මානව සම්පත්) තනතුරෙහි පිහිටුවීම නීත්‍යානුකූලය. ඒ තුළින් පළමුවන පාර්ශ්වකරුට අසාධාරණයක් හෝ අගතියක් සිදු වු බවක් පිළිගත නොහැකිය.

02. ඔහු 2016.10.01 දින සිට කළමනාකරු (මානව සම්පත්) ලෙස සී/ස ලංකා සීනි පුද්ගලික සමාගමේ සෙවනගල ඒකකයට ස්ථාන මාරු කිරීමේදී ලබා දී තිබු සියලු දීමනා වරප්‍රසාද 2018.08.05 වන දින සිට සී/ස සීනි පුද්ගලික සමාගමේ පැල්වත්ත ඒකකයට මාරු කිරීමේදී අහිමි කිරිම.

පිළිතුර - පළමුවන පාර්ශ්වකරු කළමනාකරු (මානව සම්පත්) වශයෙන් පැල්වත්ත ඒකකයේ සේවය කරමින් සිටියදී රාජකාරි අවශ්‍යතා මත සී / ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ සභාපතිවරයා විසින් ඔහු සෙවනගල ඒකකයට ස්ථාන මාරු කර ඇත. ස්ථාන මාරු කරන ලද 2016.09.20 දිනැති ලිපියේ පැහැදිළිව සඳහන් කර ඇත්තේ ඔහුට ලබා දෙනු ලබන අමතර ප්‍රවාහන දීමනාව සහ ඉන්ධන දීමනාව සෙවනගල ඒකකයේ සේවය කරන තුරු පමණක් හිමි බවයි. ඒ අනුව 2016.09.29 දින එම කොන්දේසියට යටත්ව පළමුවන පාර්ශ්වකරු එම ස්ථාන මාරුවීම භාර ගෙන ඇත. කිසියම් ආයතනයක ඒකක දෙකක් හෝ කිහිපයක් පවතින අවස්ථාවකදී එක් එක් ඒකකයේ එකම තනතුරක එකම ශ්‍රේණියක සේවය කරන පුද්ගලයින්ට ලබා දෙන දීමනාවන්වල වෙනසක් පැවතිය හැකිය. එලෙස වෙනසක් පැවතීම නිත්‍යානුකූලය. එමෙන්ම එක් සේවා ස්ථානයකදී ලැබු වැඩි වරප්‍රසාදයක් ඊළඟ සේවා ස්ථානයේදී අහිමි වීම සිදු විය හැකි අතර එය ද නීත්‍යානුකූලය. ඒ අනුව පළමුවන පාර්ශ්වකරුට කළමනාකරු (මානව සම්පත්) වශයෙන් සෙවනගල ඒකකයේදී ලැබු දීමනා පැල්වත්ත ඒකකයේ නිත්‍ය තනතුරට ස්ථාන මාරු කිරීමේදී අහිමි වීම තුලින් ඔහුට අගතියක් හෝ අසාධාරණයක් සිදු වූ බව පිළිගත නොහැකිය.

03. සී/ස සීනි පුද්ගලික සමාගමේ පැල්වත්ත ඒකකයේ නිත්‍ය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) තනතුරට පත් නොකර වැඩ බැලීම සඳහා වරින් වර වෙනත් නිලධාරීන් පත් කළද එකී තනතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) සඳහා එස්. ඒ. කමලසේන මහතා සුදුසුකම් ලබා තිබේ නම් එම තනතුර ලබා නොදීම.

2018.05.08 දින සිට පළමු වන පාර්ශ්වකරු වන එස්. ඒ. කමලසේන මයා සෙවනගල ඒකකයේ සිට නැවත පැල්වත්ත ඒකකයේ නිත්‍ය තනතුරට ස්ථාන මාරු කරන අතර, ඔහුගේ නිත්‍ය තනතුර එනම් කළමනාකරු (මානව සම්පත්) තනතුර එදින සිට ලබා දෙන අතර

එය ඔහු සෙවනගල ඒකකයේදී වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) තනතුරට වඩා පහල තනතුරක් වීම හේතුවෙන් නැවත පැල්වත්ත ඒකකයට පැමිණි දින පටන් පැල්වත්ත ඒකකයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) තනතුර ඉල්ලා සිටී.

මෙලෙස ඉල්ලා සිටීමට පදනම් වූ හේතූන් අතර

01. 2018.05.08 වන විට පැල්වත්ත ඒකකයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) තනතුර පුරප්පාඩුව තිබීම.

02. 2017.01.01 සිට 2018.05.08 දින දක්වා සෙවනගල ඒකකයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) තනතුරේ වැඩ බැලීම සිදු කර තිබීම හා මාස 16ක අත්දැකීම් හා පළපුරුද්ද සහිත නිලධාරියෙකු වීම.

03. 2017 සිට 2023 දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) තනතුර වැඩ බැලීමේ පදනමෙන් දිගින් දිගටම රාජකාරි ආවරණය කර තිබීම.

මෙම කරුණු තුන බැහැර කළ නොහැකි ප්‍රබල කරුණු 03 ක් වේ. පළමුවන පාර්ශ්වකරු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) තනතුර ලබා ගැනීම සඳහා එවකට පාලනාධිකාරිය සමග සාකච්ඡා, අභියාචනා ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කර ඇත. අනතුරුව කම්කරු දෙපාර්තමේන්තුවට, ඔම්බුඩ්ස්මන්ට වෙත ද පැමිණිලි කිරීම දක්වා දුර දිග ගොස් ඇත.

මේ ආකාරයට කරන ලද අභියාචනා දෙකකට අවස්ථා දෙකකදී සී/ස ලංකා සීනි (පුද්) සමාගම් සභාපතිවරයා පළමුවන පාර්ශ්වකරු එස්. ඒ. කමලසේන මයාට එම් 3 ශ්‍රේණියේ තනතුරක් ලබා දෙන ලෙස ප්‍රධාන විධායක නිලධාරීට නියෝග කර ඇත. ඒ අනුව එස්. ඒ. කමලසේන මයා 2019.03.29 දින කරන ලද ලිඛිත අභියාචනයට එවකට සිටි සභාපතිවරයා ඔහු සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර එම් 3 තනතුරක් ලබා දෙන ලෙස නියෝග කර ඇත. අනතුරුව 2019.06.13 වන දිනැති අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී විසින් සභාපති අමතන ලද AGM(HR) 2019/81 දරන අභ්‍යන්තර මැමය මගින් 2019.06.24 දින සභාපතිවරයා නියෝග කර ඇත්තේ එස්. ඒ කමලසේන මයා 2019.07.01 දින සිට එම් 3 තනතුරක පිහිටුවන ලෙසය. ඒ අනුව ප්‍රධාන විධායක නිලධාරී ද මානව සම්පත් අංශයට ජූලි 01 වන දිනට පෙර තනතුරේ පිහිටුවන්න යනුවෙන් සටහන් කර ඇත. එසේ තිබියදීත් එය ඉටු වී නොමැත. එය ඉටු නොකිරීමට දෙවන පාර්ශ්වය දක්වන කරුණු නීත්‍යානුකූල හා විධිමත් භාවයෙන් තොර බැවින් ප්‍රතික්ෂේප කරමි.

විශේෂයෙන් පළමුවන පාර්ශ්වකාර එස්. ඒ. කමලසේන මයා සෙවනගල ඒකකයේ වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) ලෙස පත් කරන අවස්ථාවේදී ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් පිළිබඳව සැලකිමකින් තොරව මාස 16 ක කාලයක් රාජකාරි ඉටු කරවා ගත්තේ නම් පසුව පැල්වත්ත ඒකකයේ එම තනතුරට පත් කිරීමට ඔහු නුසුදුස්සෙකු වන්නේ කෙසේද? යන්න පැහැදිලි කර ලීමට දෙවන පාර්ශ්වය අසමත් වී ඇත.

එපමණක් නොව 2018.05.08 සිට පළමුවන පාර්ශ්වකරු විශ්‍රාම ගන්වන 2022.12.31 දින දක්වා පැල්වත්ත ඒකකයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) තනතුරේ රාජකාරි ආවරණය කර ඇත්තේද "වැඩ බැලීමේ" පදනමිනි. ඒ අනුව සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ සභාපති ගේ 2019.06.24 දිනැති නියෝගය අනුව 2019.07.01 සිට එස්. ඒ. කමලසේන මයා එම තනතුරට පත් කිරීමට නෛතික බාධාවක් නොමැත. ඉහත සියලුම කරුණු සලකා පළමු වන පාර්ශ්වකරු එස්. ඒ. කමලසේන 2019.07.01 දින සිට පැල්වත්ත ඒකකයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) තනතුරේ පිහිටුවිය යුතු බව තීරණය කරමි. ඒ අනුව 2019.07.01 දින සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) තනතුරට අදාළ පහත පරිදි වැටුප් දීමනා හා වරප්‍රසාද හිමි විය යුතු බවට තීරණය කරමි.

ඒ අනුව

| | |
|---|---|
| මූලික වැටුප | රු. 39,158.00 |
| අන්තර් දීමනා | රු. 5,000.00 |
| අමතර දීමනා | රු. 1,250.00 |
| විශේෂ දීමනා | රු. 10,000.00 |
| ස්ථානීය දීමනා | රු. 7,950.00 |
| ජීවන වියදම් දීමනා | රු.7,800.00 |
| මාසික දීමනා | රු. 5,000.00 |
| එකතුව | රු. 76,158.00 |

විය යුතු බව තීරණය කරමි. (මෙම වැටුප 2023.01.01 සිට ස්ථිර පදනමින් පත් කළ සී/ස සීනි සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) වෙත ලබා දී ඇති වැටුප හා දීමනා වේ.) පළමු වැනි පාර්ශ්වකරු පැල්වත්ත ඒකකයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) තනතුර ඉල්ලා සිටිය ද, එකී තනතුරේ පිහිටු විය යුතු වැටුප් තලය හෝ දීමනා ආදිය පිළිබඳව ලිඛිත ඉල්ලීමක් සිදු කර නැත. එසේ වුවද මෙම ප්‍රශ්න ගත ආරාවුලට පාර්ශ්වයන් විසින් ගොනු කර තිබූ ලේඛනවලින් ගෙවිය යුතු වැටුප් හා දීමනා තීරණය කරමි.

ඒ අනුව ගණනය කළ හිඟ වැටුප් හා දීමනා පළමුවන පාර්ශ්වකාර එස්. ඒ. කමලසේන මයා විශ්‍රාම ගන්නා 2022.12.31 දින දක්වා ගෙවිය යුතු බව තීරණය කරමි. ඒ අනුව 2019.07.01 දින සිට 2022.12.31 දින දක්වා මාස 42 ක් සඳහා රු. 76,158 X 42 = 3,198,636/- වැටුපක් හිමි විය යුතු වේ. මෙම වැටුපෙන් දැනටමත් ගෙවා ඇති වැටුප් හා දීමනා වන රු. 2,628,181/- ක ගැලපීමෙන් අනතුරුව ශේෂය වන රු.570,455/- ක් පළමුවන පාර්ශ්වකරුට හිමි විය යුතුය. එමෙන්ම 2017 සිට 2022 දක්වා වැටුප් වර්ධක ලබා දී ඇත්නම් එය ද නිසි පරිදි ගැලපිය යුතු වේ. (පළමුවන පාර්ශ්වකරු විසින් 2023.06.07 වන දින දිවුරුම් ප්‍රකාශය සමග ගොනු කරන ලද A ලේඛනය ඇසුරින් ගෙවූ වැටුප් හා දීමනා ගණනය කර ඇත.)

ප්‍රවාහන දීමනා හා ඉන්ධන දීමනා ගෙවීම පිළිබඳ තීරණයක් ලබා නොදෙමි. එයට හේතුව මෙම තීරණය ලබා දෙන විට නිලධාරියා විශ්‍රාම ගන්වා තිබීමත් ප්‍රවාහන හා ඉන්ධන දීමනා වියදම් ප්‍රතිපූර්ණයක් වශයෙන් අනුමත කර තිබීමත් නිසාය.

ඉහත තීරණය හේතුවෙන් පළමුවන පාර්ශ්වකරුට ලබා ගැනීමට / ඉල්ලුම්කිරීමට හිමිකම් ඇති වෙනත් කවර හෝ ව්‍යවස්ථාපිත දීමනා ලබා ගැනීමට බාධාවක් නොවිය යුත්තේ ය. ඒ අනුව මෙම ප්‍රදානය ගැසට් ගත වී මසක් ඇතුළත මෙම මුදල දෙවන පාර්ශ්වය විසින් මොනරාගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතුය.

මෙම තීරණය සාධාරණ හා යුක්තිසහගත තීරණයක් බව සහතික කරමි.

නිතීඥ ඩබ්. ඒ. ජයවික්‍රම,
බේරුම්කරු,

2023 දෙසැම්බර් මස 06 වැනි දින දී ය.

EOG 02 - 0026

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.